

# ආතර්.සී. ක්ලාක් නම් ඔහු...

අද්භූත කතන්දර ගොතා රසකර කියමින් ගමේ පාසල් මිතුරන් විනෝදමත් කළ දවල් කෑම සඳහා අම්මා දුන් මුදලින් කෑම නොකා පරණ පොත් කඩවලින් විද්‍යා සඟරා ගෙන කියැවූ, තාත්තා නැති කුඩා දරුවා ආතර් සී. ක්ලාක් නමින් ලෝක ප්‍රසිද්ධ ලේඛකයකු වෙතැයි එදා ඒ ගමේ කිසිවෙක් සිතන්නට නැත. ආතර් චාල්ස් ක්ලාක් උපන්නේ 1917 දෙසැම්බර් මස 16 වැනිදා එංගලන්තයේ බටහිර පෙදෙසේ පිහිටි සමර්සෙට් ප්‍රාන්තයේ "මයින්හෙඩ්" නම් කුඩා ගම්මානයක ගොවි පවුලකයි. ඔහු ගේ පියා චාල්ස් රයිට් ක්ලාක්. රාජකීය ඉංජිනේරු හමුදාවේ ලුතිනන් වරයකුව සිට ගොවිපොළක් ආරම්භ කළ නමුත්, ආතර් සී. ක්ලාක් කුඩා අවදියේ ම පියා මිය ගියේය. මේ නිසා ආතර් ඇතුළු සොහොයුරු සොහොයුරියන් පිරිස ඇති දැඩි කොට උගන්වා, ලොකු මහත් කරනු ලැබුවේ ගොවිපොළෙන් ලද සුළු ආදායමත්, මව ගේ කාර්ය ශූරත්වයත් මගිනි.

ආතර් සී. ක්ලාක්ගේ ළමාවිය ගතවී ගියේ ද ගම්බද පරිසරයේ ය. මයින්හෙඩ් ගම්මානය මුහුදට සමීප වූ බැවින් කුඩා ආතර් බොහෝ විට තම විවේක කාලය ගත කළේ ගොඩබිම නොව දියෙහිය. ඇතැම් අවස්ථාවල මුහුද බෙහෙවින් ප්‍රචණ්ඩ වූ විටදී පවා ඔහු එය ගණන් නොගෙන මුහුදේ පිහිනීමෙහි යෙදුනේ අසල්වැසියන් සංත්‍රාසයට පත් කරවමිනි.

මුහුද මෙන්ම අහස ගැනත් කුඩා කළ සිටම ක්ලාක් මහත් උනන්දුවකින් හා කුතුහලයකින් පසු විය. තමන් විසින්ම තනා ගන්නා ලද දුරදක්නයක ආධාරයෙන් ඔහු රාත්‍රී අහස නිරීක්ෂීමට පුරුදුව සිටියේය. ශීතල කාලවල රෑ එළිමහනේ සිට අහස නැරඹීම නිසා කුඩා ආතර් සී. ක්ලාක් බරපතල ලෙස රෝගාතුර වූ අවස්ථා ද විය. මෙසේ අහසත් - සමුදුරත් කෙරෙහි කුඩා කළ ඇති වූ බැඳීම ආතර් සී. ක්ලාක් තුළ අද දක්වාම පවතී. මේ අපූරු බැඳියාව නිසා ලොව පුරා පාඨකයන්ට රස විඳීමට හැකි කෘතීන් ගණනාවක්ම ඔහු අතින් බිහිවී තිබේ.

මයින්හෙඩ් අසල නගරය වූ ටොන්ටන්හි පිහිටි 'හුයිෂ්ස් ග්‍රැමර් ස්කූල්' නම් පාසලට ඔහු දිනපතාම ගියේ බයිසිකලයෙනි. මේ මූලික අධ්‍යාපනය ලබන කාලයේ සිට ම ආතර් විද්‍යාත්මක පොත පත හා විද්‍යාත්මක කරුණු ගැන වැඩි අවධානයක් යොමු කළ අතර නොයෙක් අලුත් දේ අත්හදා බලන්නට ද පසුබට නොවීය.

1927-36 දක්වා කාලය තුළ හුයිෂ්ස් ග්‍රැමර් ස්කූල්වලින් ලැබුණ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ඉන් ඔබ්බට කරගෙන යාමට ක්ලාක් ට අවස්ථාවක් ලැබුනේ නැත. විවිධ හේතූන් මත ලන්ඩනයට ගිය ඔහු 1936- 41 වකවානුවේ බ්‍රිතාන්‍ය සිවිල් සේවයට ඇතුළු වී, එරට විගණකාධිපති දෙපාර්තමේන්තුවට බැඳී කටයුතු කළේය. ඒ අතරම එවකට ලන්ඩනයේ කිහිප දෙනෙකු එකතුවී පිහිටුවා ගෙන තිබුණු බ්‍රිතාන්‍ය අන්තර් ග්‍රහ ලෝක සංගමයට (British Interplanetary Society) බැඳී අනාගතයේ දිනෙක අභ්‍යවකාශ තරණය කිරීමේ දී මිනිසාට පැනනගින ගැටලු හා ඒවා සාර්ථකව විසඳ ගන්නා ආකාරය ගැන විවිධ සාකච්ඡා, විවාද සහ අධ්‍යයනවල ද නිරත විය.

තරුණ වියේදී එංගලන්තයේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සිවිල් සේවකයකු ලෙස කටයුතු කළ ක්ලාක්ට, එවකට එංගලන්තයේ සිටි තරුණ වයසේ පසු වූ අන් සැවොම මෙන් දෙවැනි මහා ලෝක යුද්ධ සමයේ හමුදා සේවයට බැඳෙන්නට සිදුවිය. 1941-1945 වකවානුව තුළ බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවට බැඳී තාක්ෂණික ඉංජිනේරුවකු ලෙස කටයුතු කළ ඔහු, රේඩාර් (රේඩියෝ තරංග මගින් දුරස්ථ වස්තු හඳුනා ගැනීමේ ක්‍රමය) පර්යේෂණවලට සම්බන්ධව ක්‍රියා කළේය. දෙවැනි ලෝක යුද්ධයේ අවසාන




කාලයේ මුළු ලෝකයේම අවධානයට ලක්වූ තාක්ෂණික නිමැවුම් දෙකක්, ආතර් සී. ක්ලාක්ගේ ද දැඩි අවධානයට ලක් වූයේ ය. ඒ නම් රොකට් යන්ත්‍ර සහ පරමාණු බලයයි.

ආතර් සී. ක්ලාක් ඇතුළු බ්‍රිතාන්‍ය අන්තර් ග්‍රහලෝක සංගමයේ සෙසු සාමාජිකයන් මේ නව තාක්ෂණය දෙස බැලුවේ මිශ්‍ර හැඟීම්වලින් යුතුවයි. රොකට් යන්ත්‍රය කවදා හෝ මිනිසා අභ්‍යවකාශයට ගෙන යනු ඇතැයි යන්න ඔවුන්ගේ විශ්වාසය විය. යුද්ධය හමාර වූ පසු රොකට්ටුව සාමකාමී වැඩ කටයුතුවලට යොදා ගන්නා අන්දම ඔවුන්ගේ සාකච්ඡාවලට භාජනය වීම පුදුමයක් නොවේ.

චන්ද්‍රිකා මගින් පණිවුඩ හුවමාරු කිරීම පිළිබඳ සංකල්පය ක්ලාක්ට පහළ වූයේ රොකට්ටු, මිනිස් සංහතියට සුබපලදායී ලෙස යොදා ගැනීම ගැන කල්පනා කරන අතරය. ගුවන් හමුදාවේ සේවය කරන කාලයේම මෙම අදහස විද්‍යාත්මක නිබන්ධනයක් ලෙස ලියූ ඔහු අදාළ ගණනය කිරීම සහ රූප සටහන් ද සහිතව එය එවකට බ්‍රිතාන්‍යයේ ප්‍රමුඛ පෙළේ ඉලෙක්ට්‍රොනික විද්‍යා ප්‍රකාශනයක් වූ 'වයර්ලස් වර්ල්ඩ්' (Wireless World) සඟරාවට යැවීය. ඒ ඓතිහාසික ලිපිය පළ වූයේ 1945 ඔක්තෝබර් කලාපයේ ය.

දෙවැනි ලෝක යුද්ධය හමාරවී යුරෝපය හිස ඔසවන අතරේ, ආතර් සී. ක්ලාක් ද තමනට අතරමග නතර කරන්නට සිදු වූ උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන්නට ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ කිංග්ස් කොලේජ් ආයතනයට ඇතුළු වී ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් හැදෑරුවේය. 1948 දී ඔහු එයින් පිට වූයේ මේ විෂයයන් සඳහා විද්‍යාවේදී පළමු පෙළ ගෞරව උපාධියක් ලබාගෙනය.

1949-1950 වකවානුවේ, ක්ලාක් ලන්ඩන් විද්‍යුත් ඉංජිනේරු ආයතනයේ ප්‍රකාශනයක් වූ Science Abstracts හි සහාය කර්තෘවරයකු ලෙස සේවය කරමින් එවකට ලියැවුණු භෞතික විද්‍යාත්මක නිබන්ධන සිය ගණනක් සාරාංශ කිරීමේ සහ සංස්කරණය කිරීමේ නියැළුණේය.

වෙනත් රැකියාවක් කරන අතරේ තම



ක්ලාක්ගේ විද්‍යා ප්‍රබන්ධ කෙටිකතා මෙන්ම නවකතාවලත් පොදුවේ දක්නට හැකි වැදගත් ලක්ෂණයක් නම් ඔහු සිය කතා වස්තූන්ට පදනම් කර ගන්නා පිළිගත හැකි, සම්මත විද්‍යාත්මක මූලධර්ම හා සංසිද්ධීන්ය. විද්‍යාත්මක මතවලට අනුව සිදුවිය හැකි දේ මිස නොඇසූ - නොදුටු අද්භූත මනෝ ලෝකයන් නිර්මානය කිරීම ක්ලාක්ගේ සම්ප්‍රදාය නොවේ. ඔහුගේ බොහෝ අනාවැකි නොබෝ කලකින්ම සැබෑ වූයේත් විද්‍යාත්මක පදනමක් මත පිහිටා සිට කතා ගෙතීමේ හේතුවෙනි.

ලේඛන කටයුතුවලට ප්‍රමාණවත් තරම් කාලය මිඩංගු කළ නොහැකි බව තේරුම් ගත් ආතර් සී. ක්ලාක් 1950 දී රැකියාවෙන් ඉවත්ව පූර්ණ කාලීන, වෘත්තීය ලේඛකයකු බවට පත්වූයේය. ඒ ගැන ඔහු කියන්නේ මෙසේ යි.

"පොත් ලිවීමෙන්ම බඩ වියත රැක ගැනීම (බටහිර ලෝකයේ පවා) එතරම් සාර්ථක ජීවනෝපායක් නොවෙයි." වාසනාවකට වාගේ මගේ පොත් පාඨකයන් අතර ජනප්‍රියි වූ නිසා මට ආර්ථික අතින් එතරම් අඩුපාඩුවක් වුනේ නැහැ. ඒත් ඒ විදියට එක ලේඛකයකු ඉහළට යන අතරේ තවත් සිය ගණනක් එය සාර්ථක කර ගත නොහැකිව දුක් පීඩා විඳිනවා. මා තවමත් සිතන්නේ මා ඉතා වාසනාවන්ත වූ බවයි."

ක්ලාක් තමා ලේඛකයකු ලෙස තැබූ වානිජ-මය සාර්ථකත්වය ගැන එසේ කථා කළත්, විචාරකයන් වැඩි දෙනකුගේ මතය නම් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයට නවතම මුහුණුවරක් - නව නැම්මක් හඳුන්වා දීමෙන් ඔහු පාඨකයන් අතර මහත් සේ ජනාදරයට පත්වූ බවයි. එසේම හුදෙක් විද්‍යා ප්‍රබන්ධ රචකයෙකු පම-ණක් නොවී, විද්‍යාඥයකු හැටියට ද කීර්ති නාමයක් ලබා ගැනීම නිසා පාඨකයන්ගේ ගෞරවය හා සම්මානය ද ඔහුට නොඅඩුව ලැබුණි.

ක්ලාක්ගේ විද්‍යා ප්‍රබන්ධ කෙටිකතා මෙන්ම නවකතාවලත් පොදුවේ දක්නට හැකි වැදගත් ලක්ෂණයක් නම් ඔහු සිය කතා වස්තූන්ට පදනම් කර ගන්නා පිළිගත හැකි, සම්මත විද්‍යාත්මක මූලධර්ම හා සංසිද්ධීන්ය. විද්‍යාත්මක මතවලට අනුව සිදුවිය හැකි දේ මිස නොඇසූ - නොදුටු අද්භූත මනෝ ලෝක-යන් නිර්මාණය කිරීම ක්ලාක්ගේ සම්ප්‍රදය නොවේ. ඔහුගේ බොහෝ අනාවැකි නොබෝ කලකින්ම සැබෑ වූයේත් විද්‍යාත්මක පදනමක් මත පිහිටා සිට කතා ගෙතීමේ හේතුවෙනි.

ඕස්ට්‍රේලියාව බලා 1954 දී නෞකාවකින් ගමන් ඇරඹුවේ මහා බාධක පරය අසල කිමිදී, අත්දැකීම් රැසක් එකතු කර ගන්නටයි. එහෙත් කිසිදු නොසිතූ පරිද්දෙන් ඒ ගමන අතරමගදී ඔහු තවත් සුවිශේෂ සොයා ගැනීමක් කළේය. ඒ ශ්‍රී ලංකාවයි.

1954 දෙසැම්බර් මාසයේ මැද එක් දිනෙක ක්ලාක් රැගත් 'හිමාලයා' නෞකාව දින බාග-යක් රැඳී සිටීමට කොළඹ වරායට සේන්දු විය. මේ අවසරයෙන් ගොඩබිමට බට ක්ලාක්, පැය කිහිපයක් කොළඹ හා ඒ අවට සිරිනැරඹීමෙහි යෙදුණේය. ලංකාව ගැන මීට පෙර යන්තමින් අසා තිබුණත්, පළමු වරට ඔහු මේ දිවයින දැක ගත්තේ මෙසේ අහම්බෙනි.

1960 දශකය වන විට ක්ලාක් ලංකාවට වසරකට කිහිප වරක් පැමිණ සති හෝ මාස ගණන් මෙහි ගත කරමින් නොයෙක් සාහිත්‍ය-මය හා විද්‍යාත්මක ව්‍යාපෘතිවල යෙදුණි.



එයින් ප්‍රධාන තැනක් ගත්තේ දකුණු දිග වෙරළෙන් ඔබ්බෙහි පිහිටි මහා රාවණා කොටුවට සමීපව මීට සියවස් කිහිපයකට පෙර මුහුදුබත් වූ නැවක නටඹුන් සොයා කළ අන්තරාදායක කිමිදීම්ය. එමෙන්ම ලංකාවේ මුල්ම වර්ණ චිත්‍රපටය වූ 'රන්මුතුදූව' නිපද-වනු ලැබුවේ ද ක්ලාක් - විල්සන්- ජොන්ක්ලස් ත්‍රිත්වයේ සම්මාදමෙනි.

1962 දී ක්ලාක්ට බ්‍රිතාන්‍ය ජාතික චිත්‍රපට අධ්‍යක්ෂ ස්ටැන්ලි කුබ්රික් යෝජනාවක් කලේය. "අපි වෙන කවුරුවත් නොකළ විදියේ අමුතුම මාදිලියේ විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටයක් හදමු යන්නයි ඒ. චිත්‍රපට කිහිපයකින්ම විචා-රකයන්ගේ ප්‍රශංසා දිනූ, බෙහෙවින් කුසලතා පූර්ණ අධ්‍යක්ෂවරයකු වූ කුබ්රික්ගේ, මේ යෝජනාවට අන්තිමේ දී ක්ලාක් කැමැත්ත පළ කලේය. රූපගත කරමින්, කතාව යළි යළිත් වෙනස් කරමින් මහත් පරිශ්‍රමයක් යොද තැනූ මේ චිත්‍රපටය 1968 දී දෙරට වැඩියේ '2001 අභ්‍යවකාශ චාරිකාවක්'(2001-A Space Odyssey) නමිනි.

ඒ තාක් විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටවල යොද නොගත් අන්දමේ නවීනතම දෘශ්‍ය ක්‍රම සහ කැමරා උපක්‍රම උපයෝගී කර ගනිමින් ක්‍රි. ව. 2001 දී සිදුවන අභ්‍යවකාශ චාරිකාවක් පද-නම් කරගත් මේ චිත්‍රපටය නිපදවන ලද්දේ ඇමෙරිකාවේ සහ බ්‍රිතාන්‍යයේ ය. එය 1968 දී ප්‍රදර්ශනය කෙරුණේ මිනිසා සඳ මතට පා තබන්නට මාස කීපයකට පෙරයි. මේ වකවා-නුවේ ලෝකයේ කොයි කා තුළත් අභ්‍යවකාශ ගමන් ගැන ලොකු උනන්දුවක් පැවතුණි. ඒ නිසාදෝ '2001' චිත්‍රපටය බෙහෙවින් ජනප්‍රිය විය. චිත්‍රපට ඉතිහාසයේ මෙතෙක් තැනුණු හොඳම චිත්‍රපට දහයෙන් එකක් හැටියට අද දක්වාත් '2001 සැලකෙන්නේ මෙසේ පුරෝ-ගාමී කලා සහ තාක්ෂණික උපක්‍රම රැසක් එහි යොද ගෙන තිබීම නිසායි.

'2001' චිත්‍රපට කතාවට පදනම් වුණේ ආතර් සී. ක්ලාක් විසින් ඊට කලකට ඉහත ලියන ලද The Sentinel (ආරක්ෂකයා) නම් කෙටිකතාවකි. මේ කෙටිකතාවෙන් තිර නාටකය බිහිවී චිත්‍රපටය නිපැදවුණු පසු ක්ලාක් එය නවකතාවක් ලෙස ද ලියා පළ කලේය. සාමාන්‍යයෙන් සිදුවන්නේ නවක-තාවක් ආශ්‍රයෙන් චිත්‍රපටයක් බිහිවීම වුවත්, මෙහිදී ක්ලාක් කලේ එහි අනෙක් පැත්තය. එනම් චිත්‍රපටය ආශ්‍රයෙන් නවකතාව ලිවීමය. මෙම 2001 නවකතාව, ලෝකය පුරාම බෙහෙවින් ජනප්‍රිය වූ අතර අද එය ලෝක භාෂා ගණනාවකට පරිවර්තනය වී තිබේ.

විද්‍යාව ජනප්‍රිය කිරීම, විශේෂයෙන්ම අභ්‍ය-වකාශ හා තාරකා විද්‍යා ගැන නව දැනුම සාමාන්‍ය ජනතාවට තේරුම් යන පරිද්දෙන් ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් 1962 අගදී එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික ආයතනය හෙවත් යුනෙස්-කෝවෙන් ආතර් සී. ක්ලාක්ට එහි වාර්ෂික කාලිංග සම්මානය පිරිනමන ලදී.

ක්ලාක් වඩාත්ම අගය කරන සම්මානයක් ඔහුට ලැබුනේ 1989 නොවැම්බරයේ ය. ලෝකයේ විවිධ ජාතීන්ට අයත් අජටාකාශ-ගාමීන් එකතුවී පිහිටුවා ගෙන ඇති අභ්‍යව-කාශ ගවේශකයන්ගේ සංගමය Association of Spaec Expolorers මගින් එහි ප්‍රථම විශිෂ සම්මානය ආතර් සී. ක්ලාක්ට පිරිනමන ලදී. පසු කලෙක අජටාකාශගාමීන් වූ පුද්ග-ලයන් ගණනාවක්ම ප්‍රසිද්ධියේම ප්‍රකාශ කර ඇත්තේ, තමන් මේ ක්ෂේත්‍රයට යොමු වූයේ කුඩා කළ තමන් කියැවූ ආතර් සී. ක්ලාක්ගේ විද්‍යා ප්‍රබන්ධ සහ විද්‍යා පොතපත නිසා බවයි.

ලංකාවට හොඳ නමක් ලබාදීම හා ලංකාව ගැන එතෙර යහපත් ප්‍රචාරයක් ගෙනදීම ආතර් සී. ක්ලාක් කවදත් තම සාහිත්‍යමය හා ජනමාධ්‍ය ක්‍රියාකාරකම් වලින් අපේක්ෂා කළ අතුරු අරමුණකි. බොහෝවිට ඔහු මෙරට

1962 දී ක්ලාක්ට බ්‍රිතාන්‍ය ජාතික චිත්‍රපට අධ්‍යක්ෂ ස්ටැන්ලි කුබ්රික් යෝජනාවක් කළේය. "අපි වෙන කවුරුවත් නොකළ විදියේ අමුතුම මාදිලියේ විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටයක් හදමු යන්නයි ඒ. චිත්‍රපට කිහිපයකින්ම විචාරකයන්ගේ ප්‍රශංසා දිනූ, බෙහෙවින් කුසලතා පූර්ණ අධ්‍යක්ෂවරයකු වූ කුබ්රීක්ගේ, මේ යෝජනාවට අන්තිමේ දී ක්ලාක් කැමැත්ත පළ කළේය. රූපගත කරමින්, කතාව යළි යළිත් වෙනස් කරමින් මහත් පරිශ්‍රමයක් යොදා තැනූ මේ චිත්‍රපටය 1968 දී දොරට වැඩියේ '2001 අභ්‍යවකාශ චාරිකා-වක්'(2001-A Space Odyssey) නමිනි.

වෙසෙන නිසාම ලංකාව ගැන දැනගත්තා විදේශිකයෝ ද වෙති. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය එතෙර රටවල ප්‍රචාරය කරන අය, නිතරම ආතර් සී. ක්ලාක්ගේ කීර්ති නාමය (ඔහුගේ අවසරය ද ඇතිව) යොදා ගත්තේද එහෙයිනි.

කලක් තිස්සේ 2001 නව කථාවට දෙවන කොටසක් ලිවිය නොහැකි යයි කියමින් සිටි ක්ලාක් 1982 දී 2010 දෙවන අභ්‍යවකාශ චාරිකාව(2010 Odyssey Two) ලියූ අතර, ඉන් ටික කලකට පසු පීටර් හියාම්ස් නම් අධ්‍යක්ෂවරයා යටතේ එයද චිත්‍රපටයකට නැගුණි. '2061 තුන් වන චාරිකා' ද ලියූ ක්ලාක් එහි අවසන් කොටස 3001 නමින් පළ කළේය.

ආතර් සී. ක්ලාක්ගේ විද්‍යා ප්‍රබන්ධවල දැකිය හැකි විශේෂ ලක්ෂණයක් නම් අනාගතය පිළිබඳ ඔහු දක්වන සර්ව සුභවාදී ආකල්පයයි. විශ්වයේ අපට වඩා දියුණු මිනිස් දුර්වලතා වලින් තොර වූ උත්රීතර ජීවීන් ඇතැයි යන අදහස ඔහුගේ රචනා බොහෝමයක දක්නට ලැබේ.

ආතර් සී. ක්ලාක් ගේ ප්‍රබන්ධ නොවන කෘතීන් අතුරෙන් ඉතා වැදගත් තැනක් හිමි වන PROFILES OF THE FUTURE නම් ග්‍රන්ථය කුඩා පොත් දෙකක් ලෙස සිංහලෙන් පලවී තිබේ. අනාගත විද්‍යාත්මක නිපැයුම් හා සොයා ගැනීම් පිළිබඳ සිංහල පාඨකයන්ට පළමුවැනි වරට කියවීමට ලැබුණේ මෙම පොත් දෙකෙනි.

ආතර් සී. ක්ලාක් සමාජය හා වර්තමාන ප්‍රශ්න ගැන දක්වන ආකල්ප අනාගතයේ පැතිකඩක් හා අනාගත ආශ්චර්යයන් යන මෙම පොත් දෙකේ පැහැදිලිව දක්නට ලැබේ.

ආතර් සී. ක්ලාක් පොත් ලියන්නේ නවීනතම පරිගණකයක් භාවිත කරමිනි. මුල් කාලයේ විද්යුත් යතුරු ලියනයක ලියූ ඔහු 1980 දශකය මුලදී පරිගණකයක පොත් ලිවීම ඇරඹීය.

යම් පොතක් ලියා හමාර වූවාට පසු ඒ අත්පිටපත අඩංගු පරිගණක තැටිය ප්‍රකාශකයා වෙත යවනු ලැබේ. පොත්වල සෝදුපත් බැලීම බොහෝවිට සිදුවන්නේ චන්ද්‍රිකා සන්නිවේදනයෙනි. ආතර් සී. ක්ලාක් ගේ බ්‍රිතාන්‍ය කාර්යාලය පොත්පත්වල නීතිමය හා ආර්ථික අංශ ගැන බලා ගනී. මීට අමතරව ඇමරිකාවේත්, එංගලන්තයේත් ක්ලාක්ගේ නියෝජිතයෝ වෙති.

ආතර් සී. ක්ලාක් දැන් තනිකඩ දිවියක් ගත කළත්, ඔහු සැමදමත් තනිකඩයකුව සිටියේ නැත. හැරිලින් මේෆිල්ඩ් නම් කාන්තාවක් සමග 1953 දී විවාහ වුවත් 1964 දී එය සුහද දික්කසාදයකින් අවසන් විය.

කොම්පියුටර්, පණිවිඩ හුවමාරු, රොබෝ තාක්ෂණය, අභ්‍යවකාශ විද්‍යා හා බලශක්ති සම්බන්ධයෙන් පර්යේෂණ කිරීමට හා අපේ රටටත්, තුන්වන ලෝකයටත් උචිත පරිදි තාක්ෂණය සකස් කර ගැනීමට 1984 දී ශ්‍රී ලංකා රජය විසින් පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලද නව තාක්ෂණය සඳහා වූ මධ්‍යස්ථානය, ආතර් සී. ක්ලාක්ගේ නමින් නම් කරන ලදී.

මේ මධ්‍යස්ථානයේ මුල්ම ගොඩනැගිල්ල ඉදිවූයේ 1982 තමන්ට ලැබුණු මාකෝනි ත්‍යාගය ක්ලාක් විසින් මෙම මධ්‍යස්ථානයට පරිත්‍යාග කිරීමෙනි.

***(එස්.එම්.බන්දුසීල විසින් පසුගිය නවයුගය කලාපයකට සැපයූ ලිපියක් ඇසුරෙනි)***

❑

# ආචාර්ය ක්ලාක් ලැබූ ගෞරව උපාධි හා සම්මානවලින් කීපයක්

* **පෙනිසිල්වේනියාවේ බීවර් විද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය** (DSc) **- 1971 දී අභ්‍යවකාශ සන්නිවේදන සම්මානය** (AIAA) **- 1974**
* **මොරටුව විශ්ව විද්‍යාලයයෙන් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය** (DSC) **- 1979**
* **ශ්‍රී ලංකා රජය විසින් පිරිනැමූ ජනාධිපති විද්‍යා සම්මානය (විද්‍යා ජෝති සම්මානය) - 1986**
* **චාල්ස් ඒ. ලින්ඩ්බර්ග් සම්මානය – 1987**
* **බාත් සරසවිය විසින් පිරිනැමූ ආචාර්ය උපාධිය** (D.Lit) **- 1988**
* **ආර්.ඒ.හෙයින්ලෙයින් අනුස්මරණ සම්මානය - 1989**
* **ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංගමයේ යාවජීව සභාපති තනතුර - 1990**
* **ජාත්‍යන්තර විද්‍යා ප්‍රතිපත්ති පදනමේ සම්මානය – 1992**
* **නොබෙල් සාම ත්‍යාගයට නම් කිරීම - 1994**
* **ලිවර්පූල් සරසවියෙන් පිරිනමන ආචාර්ය උපාධිය** (D.Lit) **- 1995**
* **හියුගෝ සම්මානය 1956, 1974, 1980 වසරවලදී හිමිකර ගැනීම**
* **නෙබියුලා සම්මානය 1973, 1974, 1979 වසරවලදී හිමිකර ගැනීම**
* **ගැලැක්සි සම්මානය - 1979**
* **මාකෝනි සම්මානය - 1982**

# නිර්මාණ අතරින් කීපයක්

A Cross the sea of Stars
A gaints the fall of night
Childhood's End
Prelude to Mars
Prelude to Space
Reach for tomorrow
The Sentinel
2001 A Space Odyssey
2010 Odyssey two
2061 Odyssey Three
3001 The Final Odyssey

ඇතුළු විද්‍යා ප්‍රබන්ධ 37 ක් ඔහු ලියා ඇත.

ප්‍රබන්ධ නොවන පොත් 42 ක් පමණ ද ඔහු ලියා තිබේ.

සයිමන් වෙල්නොයා හා ජෝන් ෆෙයාර්ලි හා එක්ව කළ නිර්මාණ

Mysterious World
World of Strange Powers